# කාර්යසාධන වාර්තාව
# செயல்திறன் அறிக்கை
# Performance Report

# 2019



## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
## மாவட்ட செயலகம் - ஹம்பாந்தோட்டை
## District Secretariat – Hambantota

# කාර්යසාධන වාර්තාව - 2019

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට

**2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට**

**වැය ශීර්ෂ අංක 263**

අන්තර්ගතය පිටු අංකය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 01-30

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 31

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 32-48

- විගණකාධිපති වාර්තාව (ඇමුණුම 01)

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 49

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 50

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ 51-53

පරිච්ඡේදය 07- අනුකූලතා වාර්තාව 54-59

<u>01 පරිච්ඡේදය</u>

## 1.1 හැඳින්වීම.

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

හම්බන්තොට යන නම සෑදුන ආකාරය පිළිබඳව එන මත දෙකකි. එයින් වඩාත් ප්‍රචලිත මතය වනුයේ "**හම්බන්** " නැමති යාත්‍රා විශේෂය පැමිණියා වූ තොටුපල හම්බන්තොට වූ බවයි. මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන්ට අනුව මැලේ යාත්‍රාවන් මෙහි පැමිණි නිසා හම්බන්තොට යන නම මෙම මුහුදු තොටට ලැබී ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් වන ප්‍රදේශය ලක් ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ සංස්කෘතියකට හා ශිෂ්ටාචාරයකට පදනම් වූ භූමි භාගයක පිහිටි ඓතිහාසික රෝහණ රාජ්‍යයේ කොටසකි. ආර්ය ජනාවාස ඇති වීමට පෙර මේ ප්‍රදේශ පිළිබඳව ප්‍රාග් ඓතිහාසික තොරතුරු එතරම් දක්නට නැතත් රාක්ෂ හා යක්ෂ යන නම් වලින් හැඳින්වූ දියුණු යයි සැලකිය හැකි ගෝත්‍රිකයන් දෙකොටසක් මෙහි වාසය කළ බවට සාක්ෂි ඇත.

නිවහල් ජාතියක් අදීන සභ්‍යත්වයක් හා නිර්මල බෞද්ධ සංස්කෘතියක් ගොඩ නැංවීමෙහි ලා මෙම ප්‍රදේශයෙන් ලද පිටිවහල විශාලය. අනුරපුර හා පොළොන්නරු රාජධානී දකුණු ඉන්දීය ආක්‍රමණිකයන්ට යටත් වූ අවස්ථා වල හෙළ උරුමය රැක ගැනීමට පෙරමුණ ගත්තෝ රුහුණු නර විරුවෝය. දුටුගැමුණු, ධාතුසේන, විජයබාහු වැනි නර පතියනට හෙළය එක් සේසත් කිරීමට උරදුන්නෝ රුහුණු ජනතාවය. බුදු සසුන විනාශ මුඛයට ගිය අවස්ථා වල එය ආරක්ෂා වූයේ රුහුණු වෙහෙර විහාර වලය. අනුරපුර රාජධානියේ ජනතාව සාගතයෙන් මුහුණ පෑ විට මෙන්ම ජාතික නිදහස තකා හෙළයන් සටන් වැදුන අවස්ථා වල ඔවුනට බත සැපයුනේ රුහුණේ කෙත් බිම් වලිනි. එම ශ්‍රේෂ්ඨ රුහුණු පුරවරයේ කොටසක් ලෙස හම්බන්තොට වැදගත් වේ. යටත් විජිත සමය ආරම්භයේ පෘතුගීසි පාලනයට නතු වූ යුගයේ ද උඩරට රාජ්‍ය ලුණු ලබාගත්තේ හම්බන්තොටින් බව සඳහන් වේ. බ්‍රිතාන්‍ය යුගයේදී හම්බන්තොට වරායක් වශයෙන්ද, නාගරික මධ්‍යස්ථානයක් වශයෙන් ද, තව දුරටත් දියුණු කරන ලදි. ඒ අනුව බ්‍රිතාන්‍යයෝ හම්බන්තොට නගරය තුළ කච්චේරියක්, රජයේ දෙපාර්තමේන්තු වල කාර්යාල රැසක්, පාසල්, පොලිස් ස්ථානයක්, රෝහලක් හා උසාවියක් ස්ථාපනය කොට එය දිස්ත්‍රික්කයේ ප්‍රධානම පරිපාලන නගරය බවට පත් කළහ.

බ්‍රිතාන්‍ය යුගයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගම්මුලාදෑනී වසම් 72 කින් යුත් බටහිර ගිරුවාපත්තුව වසම් 36 කින් යුත් නැගෙනහිර ගිරුවාපත්තුව හා වසම් 28 කින් යුත් මාගම්පත්තුව ලෙස කොටස් තුනකට බෙදී පැවතින මෙයින් භූමි ප්‍රමාණය අනුව විශාලත්වයෙන් වැඩිම වූයේ මාගම්පත්තුවයි.ශ්‍රී ලංකාවේ ගිනිකොණ දිග සීමාව පිහිටා ඇති හම්බන්තොට දිස්ත්‍රික්කය විශාලත්වයෙන් වර්ග කි.මී. 2609 කි. මෙය දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 1/25 පමණ වේ. දිස්ත්‍රික්කයේ උපරිම දිග කි.මී. 106 ක්ද උපරිම පළල කි.මී. 39 ක්ද වේ. දිස්ත්‍රික්කයට අයත්වන වෙරළබඩ තීරයේ දිග කි.මී. 151 කි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් ව.කි.මී. 11.5 ක් පමණ අභ්‍යන්තර ජලාශ වලින් වැසී ඇත. අක්ෂාංශ හා දේශාංශ පිහිටීම අනුව උතුරට 6.0 සිට 6.5 දක්වාද නැගෙනහිර දේශාංශ 80.6 සිට 81.7 දක්වා ද විහිදී ඇත. උතුරට මොණරාගල හා රත්නපුර දිස්ත්‍රික්ක වලින්ද බටහිර මාතර දිස්ත්‍රික්කයෙන්ද දකුණට ඉන්දියන් සාගරයෙන්ද නැගෙනහිරට ඉන්දියන් සාගරයෙන් හා අම්පාර දිස්ත්‍රික්කයෙන්ද මෙම දිස්ත්‍රික්කය මායිම් වී ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇති ස්වභාව ධර්මයේ සුවිශේෂී දායාදයන් වන තංගල්ල ප්‍රා.ලේ. කොට්ඨාශයේ පිහිටි හුම්මානය හා සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි උණු දිය උල්පත් හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උසන්ගොඩ ප්‍රදේශය මෙරට දක්නට ඇති දුර්ලභ භූ විද්‍යාත්මක ලක්ෂණයන්ය. අම්බලන්තොටින් ඔබ්බෙහි පිහිටි මදුනාගල නම් සුපතල ආරණ්‍ය සේනාසනයට නුදුරින් මේ උණුදිය උල්පත් පිහිටා ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජලවහන රටාව ප්‍රධාන ගංගා සහ ස්වභාවික ජල මාර්ග 19 ක් පිහිටා ඇත. ඒවා පහත දැක්වේ.

| ගංගාව | දිග (සැතපුම්) |
|---|---|
| සීනිමෝදර ඔය | 5 |
| කිරම ඔය | 20 |
| රැකව ඔය | 4 |
| ඌරුබොකු ඔය | 26 |
| කච්චිගල්ආර ඔය | 13 |
| වලවේ ගඟ | 85 |
| කරගන් ඔය | 45 |
| මලල ආර | 34 |
| ඇඹිලිගල් ඔය | 85 |
| කිරිදි ඔය | 73 |
| දඹාවේ ආර | 35 |
| මහසිලාවේ ඔය | 8 |
| හූතව ඔය | 8 |
| මැණික් ගඟ | 71 |
| කටුපල ආර | 11 |
| කරන්ද ආර | 16 |
| නමඩගස් ආර | 4 |
| කරඹේ ආර | 3 |
| කුඹුක්කන් ඔය | 72 |

මේ අතරින් වලවේ ගඟ, කිරිඳි ඔය, මැණික් ගඟ, ඌරුබොකු ඔය, හා කච්චිගල්ආර මෙන්ම දිස්ත්‍රික්කයේ නැගෙනහිර මායිමේ පිහිටි කුඹුක්කන් ඔය ද ප්‍රධාන ජල මාර්ග වේ. මාස් කන්නය හෙවත් ඊසාන දිග මෝසම් කාලයේදී (නොවැ -මාර්තු ) මෙම ගංඟාවල ජල මට්ටම ඉහළ යන අතර මාස් කන්නය හෙවත් නිරිත දිග මෝසම් කාලයේදී (මැයි - සැප්තැම්බර් ) ජල මට්ටම පහත බසී.

දිස්ත්‍රික්කයේ ඇති ප්‍රධාන වැව් හා අභ්‍යන්තර ජලාශ 13 න් විශාලතම වන්නේ රිදියගම වැව වුවද වැඩිම ජල ධාරිතාවක් අඩංගු වන්නේ මුරුතවෙල හා ලුණුගම්වෙහෙර යන ජලාශ වලය. වැඩි වැව් ප්‍රමාණයක් පිහිටා ඇත්තේ තිස්සමහාරාමය ප්‍රදේශය ආශ්‍රිතවය. දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන වශයෙන් වාරිමාර්ග සංවර්ධන යෝජනා ක්‍රම කිහිපයක් පසුගිය අවදියේ ක්‍රියාත්මක වී ඇත. උඩවලව සංවර්ධන ව්‍යාපාරය, කිරම ඔය ව්‍යාපාරය, ඌරුබොකු ඔය ව්‍යාපාරය, ලියන්ගස්තොට ව්‍යාපාරය, රිදියගම ව්‍යාපාරය, ලුණුගම්වෙහෙර ව්‍යාපාරය, මව් ආර ව්‍යාපාරය සහ කැකිරිඔබඩ ව්‍යාපාරය මේවා අතර වේ. දිස්ත්‍රික්කයේ ඇති ගොවි ජනපද ව්‍යාපාර වශයෙන් මහගල් වැව, බඳගිරිය, බැරගම හා මුරුතවෙල ව්‍යාපාර දැක්විය හැකිය.

බටහිරින් කුඩාවැල්ලේ සිට නැගෙනහිර පට්ටනංගල දක්වා විහිදුන හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් වෙරළ තීරය දර්ශනීය වෙරළබඩ ලක්ෂණ රැසකින් සමන්විත වේ. ඒ අතර තුඩු, කළපු, බොකු, වැලිපර මුහුදු දඹ සහ ගං මෝය වැනි ලක්ෂණ වැදගත්ය. ඊට අමතරව ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් වැදගත් වන වරාය, තොටුපල හා කළපු වලට විශේෂ ස්ථානයක් හිමි වේ. කුඩාවැල්ල, තංගල්ල, හම්බන්තොට හා කිරින්ද වරායන් නවීන පහසුකම් සහිත ධීවර වරායන් ලෙස මේ වන විට සංවර්ධනය වී ඇත. ඊට අමතරව ධීවර කටයුතු කෙරෙන කුඩා ධීවර වරායන් සහ කළපු රැසක්ද ඇත. ජාතික ලුණු නිෂ්පාදනයට බෙහෙවින් දායක වන ලුණු ලේවායන් කිහිපයක්ද මෙම වෙරළ තීරයේ දක්නට ඇත. හම්බන්තොට මහ ලේවාය, කොහොලංගල ලේවාය හා පලටුපාන ලේවාය ඉන් ප්‍රධානය.

වියළි හා අර්ධ ශුෂ්ක දේශගුණික ලක්ෂණ බහුල මෙම දිස්ත්‍රික්කයේ පාරිසරික හා දේශගුණික විචල්‍යතාවය මොනවට පෙන්නුම් කරමින් තෙත් කලාපීය ලක්ෂණද මඳ වශයෙන් දක්නට ලැබේ. දිස්ත්‍රික්කයේ බටහිර සීමාවේ කඳු බෑවුම් දිගේ ඇද හැලෙන කුඩා දිය ඇළි කිහිපයක් ඇත. අඩි 40 ක් උස බිසෝගල හෙවත් සපුගහ දොළ ඇල්ල මේ අතරින් ප්‍රධාන වේ. ප්‍රදේශයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 27.8 ක් වේ. මධ්‍ය වාර්ෂික වර්ෂාපතනයේ සාමාන්‍ය මි.මී. 111.1 කි.

පරිපාලනමය වශයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 කටද ග්‍රාම නිළධාරී වසම් 576 කටද බෙදා ඇත. ඊට අමතරව මහ නගරසභා 01 ක්, නගර සභා 01 ක්ද ප්‍රාදේශීය සභා 10 ක්ද මැතිවරණ කොට්ඨාශ 04 ක්ද වේ. අනෙකුත් බෙදීම් යටතේ පොලිස් බල ප්‍රදේශ 13 ක්ද , අධ්‍යාපන කලාප 03 ක්ද, ගොවි ජන සේවා බල ප්‍රදේශ 16 ක්ද, සෞඛ්‍ය වෛද්‍ය කොට්ඨාශ 10 ක්ද දක්නට ලැබේ.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ 2019 ඇස්තමේන්තුගත මුළු ජනගහනය 713,453ක් වන අතර එය පිරිමි 349,753ක් හා ගැහැණු 363,700ක් ලෙසද වේ. මේ අනුව ජන ඝනත්වය වර්ග කිලෝ මීටරයට 251 කි.

ජාතීන් අනුව 97.1% ක් සිංහලද, 0.4 % ක් දෙමළද, 1.1% ක් ශ්‍රී ලංකා යෝනකද වේ. ආගම අනුව 96.8 % ක් බෞද්ධ ද, 0.2 % ක් හින්දු ද, 2.5 % ක් ඉස්ලාම් ද වේ. දිස්ත්‍රික්කයේ වී වගාවට අයත් මුළු බිම්

ප්‍රමාණය හෙක්ටයාර් 36057.40 ක් වේ. වී වගා කරන බිම් ප්‍රමාණයෙන් 76% ක් ම මහා වාරිමාර්ග වලින් පෝෂණය වේ. සත්ත්ව පාලනය අනුව මෙහි මීකිරි හා එළ කිරි නිෂ්පාදනය ද බහුලව සිදු වේ.

මෑත භාගයේ සිට ඉතා සීඝ්‍ර සංවර්ධනයක් කරා යොමු වී තිබෙන මෙම දිස්ත්‍රික්කයේ අනාගත සංවර්ධනය ඇදහිය නොහැකි මට්ටමකට ඉහළ යනු ඇත. දැනට ක්‍රියාත්මක වන හම්බන්තොට ජාත්‍යන්තර වරාය, අන්තර් ජාතික ගුවන් තොටුපල, පරිපාලන සංකීර්ණය, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, මහාවාරි යෝජනා ක්‍රම, නව දුම්රිය මාර්ගය, අධිවේගී මාර්ග පද්ධතිය, ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය සහ සංචාරක ව්‍යාපෘති වලින් ලැබෙන පිටිවහල මගින් දිස්ත්‍රික්කයේ අනාගත සංවර්ධනය වඩාත් වේගවත් කරනු ඇත.

## දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යාත්මක තොරතුරු

| කරුණ | විස්තරය |
|---|---|
| දිස්ත්‍රික්කය | හම්බන්තොට |
| පළාත | දකුණු පළාත |
| සමස්ත භූමි ප්‍රමාණය | ව.කි.මී. 2609 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 12 |
| ග්‍රාම නිළධාරී වසම් සංඛ්‍යාව | 576 |
| ගම්මාන සංඛ්‍යාව | 1338 |
| මැතිවරණ කොට්ඨාශ සංඛ්‍යාව | 4 |
| මහ නගර සභා සංඛ්‍යාව | 1 |
| නගර සභා සංඛ්‍යාව | 1 |
| ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | 10 |
| අමාත්‍යාංශය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති සංචාරක බංගලා සහ නිල නිවාස සංඛ්‍යාව | සංචාරක බංගලා - 01<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති නිල නිවාස - 33 |
| කලාප අධ්‍යාපන කාර්යාල සංඛ්‍යාව | 3 |
| පාසල් සංඛ්‍යාව හා ගුරුවරු සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාව - 321<br><br>ගුරුවරු සංඛ්‍යාව - 8481 |
| දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව | 7 |
| පළාත්සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව | 11 |
| නගරසභා/ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව | 142 |
| ජනගහනය | පිරිමි - 349,753<br>ගැහැණු - 363,700<br>**එකතුව - 713,453** |

## හම්බන්තොට දිස්ත්‍රික් සිතියම



**1.2 හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය දැක්ම , මෙහෙවර සහ අරමුණු**

### දැක්ම

"කාර්යක්ෂම දිස්ත්‍රික් පරිපාලනයක් තුලින් විශිෂ්ටතම මහජන සේවාවක්"

### මෙහෙවර

"ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව, සාධාරණව, යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටුකරමින් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව මනා සම්පත් කළමනාකරණය හා සම්බන්ධීකරණය තුලින් දිස්ත්‍රික්කය තුළ තිරසාර සංවර්ධනයක් තහවුරු කිරීම."

# අරමුණු

- කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් පරිපාලනයක් පවත්වා ගෙන යාම.
- ජනතා තෘප්තිය ඉහළ නැංවෙන ආකාරයෙන් රාජ්‍ය අංශය මඟින් කාර්යක්ෂම සේවා සැපයීමක් සහතික කිරීම.
- යහපත් ආකල්ප, වගකීම්, විචක්ෂණශීලීව සම්පත් භාවිතය, අපක්ෂපාතීත්වය, විනිවිදභාවය ආදී සාර පද්ධතීන් රාජ්‍ය සේවය තුළ ස්ථාපිත කිරීම.
- රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්ති වලට අනුව වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා මණ්ඩල හා අධිකාරීන් මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ව්‍යාපෘති සංවිධානය කිරීම, මූල්‍යමය හා මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසුවිපරම් කටයුතුවල සම්බන්ධීකාරක ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුභ සාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.
- දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගෙන් විවිධ වූ ආර්ථික සමාජ හා සංස්කෘතිකමය අවශ්‍යතාවයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 12 ක් ඔස්සේ ඉටු කර දීම
- දිස්ත්‍රික්කයේ රාජ්‍ය නියෝජිතයා වශයෙන් ක්‍රියාකරමින් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන සංවිධාන වලට නිවැරදි හා නිශ්චිත තොරතුරු ග්‍රාමීය ප්‍රාදේශිය මට්ටමින් එක්රැස් කර ඒකාබද්ධ කර සපයා දීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල ඔස්සේ රජයේ විවිධ දෙපාර්තමේන්තු වෙනුවෙන් දිස්ත්‍රික්කය තුළ ඔවුනට හිමි ආදායම් එක්රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා මහා භාණ්ඩාගාරය වෙත සම්ප්‍රේෂණය කිරීම.
- ගංවතුර, සුළිසුළං, නියඟ, මුහුද ගොඩ ගැලීම වැනි හදිසි ආපදා අවස්ථාවන්හිදී, ජනතාවට අවශ්‍ය ක්ෂණික සහන සේවාවන් හා ආධාර ලබා දීම, ඔවුන්ගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම.
- අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම, අධ්‍යාපනික සංවර්ධනය සහ දැනුම කුසලතා සංවර්ධනය කිරීම.

**1.3 ප්‍රධාන කාර්යයන්**

01. සිවිල් පරිපාලන කටයුතු

02. ආදායම් එක් රැස් කිරීම

03. ප්‍රාදේශිය ලේකම් කාර්යාල කටයුතු අධීක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම

04. දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩ සටහන් සම්බන්ධීකරණය

05. දිස්ත්‍රික්කය තුළ දිළිඳුකම අවම කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය

06. මැතිවරණය මෙහෙයවීම

07. දිස්ත්‍රික්කය තුළ ආපදා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය

08. ගිනිඅවි හා පුපුරන ද්‍රව්‍ය වලට අදාළ කටයුතු කිරීම

09. වෙළෙඳපොළ විමර්ශන,වෙළෙඳපොළ වැටලීම් හා පාරිභෝගික සවිබල ගැන්වීම තුළින් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

10. දිස්ත්‍රික්කය තුළ වෙළඳ, වාණිජ, නිෂ්පාදන හා කර්මාන්ත ක්ෂේත්‍රවල මිනුම් විද්‍යාව පදනම් වූ සේවාවන් සැපයීම

11. සංස්කෘතික කටයුතු, බෞද්ධ කටයුතු හා පාරිසරික සංවර්ධන කටයුතු මෙහෙයවීම

12. සමාජ සේවා හා සුභසාධන කටයුතු කිරීම

13. ජාතික උත්සව සංවිධානය කිරීම

# 1.4. සංවිධාන සටහන



දිස්ත්‍රික් ලේකම්
අධ්‍යක්ෂ (කෘෂිකර්ම)
අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)
සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)
අධ්‍යක්ෂ ( දිවි නැගම)
අතිරේක දිස්ත්‍රික් ලේකම්
අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්)
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සහකාර මැතිවරණ කොමසාරිස්
සහකාර අධ්‍යක්ෂ (ආපදා කළමනාකරණ)
සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්)
සහකාර අධ්‍යක්ෂ (කුඩා ව්‍යාපාර)
සහකාර දිස්ත්‍රික් ලේකම්
පරිපාලන නිලධාරී
දිස්ත්‍රික් ඉංජිනේරු
සහකාර මෝ/රථ කොමසාරිස්
සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක
ඉඩම් රෙජිස්ට්‍රාර් හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
සංඛ්‍යා ලේඛනඥ
ගණකාධිකාරී
යාන්ත්‍රික ඉංජිනේරු
මැතිවරණ අංශය
කෘෂිකර්ම අංශය
ක්‍රම සම්පාදන අංශය
දිවි නැගුම අංශය
ආපදා කළමනාකරණ අංශය
සමාජ ආරක්ෂණ අංශය
ඉඩම් පරිහරණ සැලසුම් අංශය
මිනුම් හා ප්‍රමිති සේවා අංශය
භාෂා පරිවර්තන අංශය
කුඩා ව්‍යාපාර අංශය
විමර්ශණ අංශය
පාරිභෝගික සේවා අංශය
සමාජ සේවා අශය
ආයතන අංශය හා ක්ෂේත්‍ර නිලධාරී අංශය
සංස්කෘතික හා බෞද්ධ කටයුතු අංශය
ඵලදායිතා අංශය
ඉංජිනේරු අංශය
ළමා ආරක්ෂණ අංශය
මෝටර් රථ අංශය
පුපුරණ ද්‍රව්‍ය පාලන අංශය
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශය
සංඛ්‍යා ලේඛන අංශය
මාධ්‍ය ඒකකය
ගිණුම් අංශය
වෘත්තීය මාර්ග උපදේශක අංශය
නඩත්තු අංශය
අභ්‍යන්තර විගණන අංශය
ක්ෂේත්‍ර නිලධාරීන්/ සංවර්ධන නිලධාරීන්/ රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්
කණිෂ්ඨ කාර්ය මණ්ඩලය ( රියදුරු හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන්)

**අනුමත සේවක සංඛ්‍යා පිළිබඳ තොරතුරු**

**2019.12.31 දිනට**

| වර්ගය | කළමණාකරණ සේවා චක්‍රලේඛය අනුව අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | |
| දිස්ත්‍රික් ලේකම් | 1 | 0 | 1 |
| අතිරේක දිස්ත්‍රික් ලේකම් | 2 | 1 | 1 |
| අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | 1 | 1 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| සහකාර දිස්ත්‍රික් ලේකම් | 1 | 1 | - |
| සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | 4 | 3 | 1 |
| ගණකාධිකාරී | 1 | 1 | - |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 2 | 2 | - |
| **උප එකතුව** | **14** | **11** | **3** |
| **තෘතීය මට්ටම** | | | |
| පරිපාලන නිළධාරී | 1 | 1 | 0 |
| භාෂා පරිවර්තක | 2 | 1 | 1 |
| **උප එකතුව** | **3** | **2** | **1** |
| **ද්විතීය මට්ටම** | | | |
| සංවර්ධන සම්බන්ධීකාරක | 1 | 0 | 1 |
| අයවැය සහකාර | 1 | 1 | 0 |
| සංවර්ධන නිළධාරී | 35 | 35 | - |
| තාක්ෂණික නිළධාරී | 2 | 1 | 1 |
| සැලසුම් ශිල්පී (Draftsman) | 1 | 1 | - |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | 33 | 28 | 5 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 2 | - | 2 |
| තාක්ෂණ සහායක | 2 | 2 | - |
| **උප එකතුව** | **77** | **68** | **9** |
| ප්‍රාථමික මට්ටම | | | |
| රියදුරු | 10 | 9 | 1 |
| විදුලි කාර්මික (දෙපාර්තමේන්තු) | 1 | 0 | 1 |
| බංගලා භාර /කෝකියා | 1 | 0 | 1 |
| කාර්යාල සේවක සේවය | 14 | 14 | 0 |
| **උප එකතුව** | **26** | **23** | **3** |
| **මුළු එකතුව** | **120** | **104** | **16** |

## 1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අංශ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12

### 1. ආයතන අංශය

**දැක්ම:** මෙහෙවර ඉටුකර අරමුණු සපුරමු

**මෙහෙවර :** දිස්ත්‍රික්කය තුල තිරසාර සංවර්ධනයක් උදෙසා කර්යාල කටයුතු හා ක්ෂේත්‍ර කටයුතු මනා සම්බන්ධීකරණය තුලින් විශිෂ්ඨ මහජන සේවාවක් උදෙසා කැපවීම.

**අරමුණු :** දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සියලුම නිලධාරින්ගේ ආයතන කටයුතු, රාජ්‍ය නිලධාරින් පුහුණු කිරීමේ වැඩසටහන්, ගිනි අවි බලපත්‍ර සහ පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ලබා දීම, සහ මහජන පැමිණිලි සඳහා විසඳුම් ලබා දීම.

**ඉටු කරනු ලබන කාර්යයන්**

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලුම නිලධාරින්ගේ සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල සියලුම නිලධාරින්ගේ ආයතන කටයුතු.
- ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම හා අනෙකුත් නිලධාරින්ගේ ආයතන කටයුතු හා විනය කටයුතු.
- දිස්ත්‍රික්කයේ සියලුම ග්‍රාම නිලධාරින්ගේ ආයතන කටයුතු හා විනය කටයුතු.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම.
- බලපත්‍ර සම්බන්ධ කටයුතු කිරීම (ගිනි අවි බලපත්‍ර සහ පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර).
- වාහන සම්බන්ධ සියලු නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු.
- මැතිවරණ විෂයට අදාල සම්බන්ධීකරණ කටයුතු.
- විවිධ සමාජ සේවා සුභසාධන කටයුතු.
- රාජ්‍ය උත්සව සංවිධානය කිරීම.
- රාජ්‍ය නිලධාරින්ගේ පදිංචිය සඳහා රජයේ පොදු නිවාස ලබා දීම, නිවාස නඩත්තුව සහ නිවාස කුලී අය කිරීම.
- සංස්කෘතික කටයුතු, බෞද්ධ කටයුතු සහ පාරිසරික කටයුතු මෙහෙයවීම.
- මානව සම්පත් සංවර්ධනය සහ ඵලදායිතාවය වර්ධනය සඳහා නිලධාරින් වෙනුවෙන් පුහුණු සිදු කිරීම.
- දිස්ත්‍රික්කය තුල ආපදා කළමනාකරණ කටයුතු මෙහෙයවීම.
- වන අලි හා වන්දි ගෙවීම පිළිබඳ සියළුම රාජකාරී.

- අබිං කමිටු වලට අදාල රාජකාරී.
- තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාල රාජකාරී.
- සංචාරක නිවාස වෙන් කිරීම නඩත්තු කිරීම පවත්වා ගැනීම පිළිබඳ රාජකාරී.
- ප්‍රාදේශීය ලේකම් වල ඉඩම් ගැටළු, මහජන පෙත්සම් හා පැමිණිලි සම්බන්ද රාජකාරී.
- කොස් ඇතුළු දැව සම්බන්ද රාජකාරී.
- ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබෙන ලිපි වලට අදාල රාජකාරී.
- දිස්ත්‍රික්ක ලේකම් හා ප්‍රාදේශීය ලේකම් පවිත්‍රතා කටයුතු.

## 2. ඉංජිනේරු අංශය

**දැක්ම :** කාර්යක්ෂම දිස්ත්‍රික් පරිපාලනයක් තුලින් විශිෂ්ඨ මහජන සේවාවක්

**මෙහෙවර:** ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව, සාධාරණව, යුක්ති ගරුකව හා මිත්‍රශීලිව ඉටු කරමින් රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව මනා සම්පත් කළමනාකරණය හා සම්බන්ධීකරණය තුලින් දිස්ත්‍රික්කය තුල තිරසාර සංවර්ධනයක් තහවුරු කිරීම.

**අරමුණ හා පරමාර්ථ:** දිස්ත්‍රික්කය තුල ඉදිකිරීම් අවශ්‍යතා සපුරමින් ජනතා අවශ්‍යතා ඉටු කිරීම.

## 3. සමාජසේවා අංශය

**දැක්ම:**

2030 වන විට ආන්තිකරණයට හා අවාසි සහගත තත්වයන්ට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය සපිරි සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ පුරෝගාමිය වීම.

**මෙහෙවර:**

ඉලක්ක ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබලගැන්වීම තුලින් සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තීයවේදිමය මැදිහත්වීම මගින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායිව පර්යේෂණ පැවැත්වීම, ප්‍රතිපත්ති සම්පාදන සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීම.

**ප්‍රධාන කාර්යයන්**

- ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම, ස්වයං රැකියා සඳහා වෘත්තීය මෙවලම් ලබා දීම හා විවෘත රැකියා සඳහා යොමු කිරීම.
- ආබාධ සහිත වූවන් සඳහා රැකියා වෙළඳපොල හඳුනා ගැනීම හා පුළුල් කිරීම
- ආබාධ සහිත වූවන්ගේ කාලීන අවශ්‍යතා හා ප්‍රවනතා හඳුනා ගැනීමට පර්යේෂණ සිදු කිරීම.
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා ආධාරක උපකරන සැපයීම හා ආබාධ සහිත පුද්ගලයින්ගේ පවුල් සවි බල ගැන්වීම.
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත්වීම තුලින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.
- සේවා සපයන නිලධාරින්ගේ දැනුම කුසලතා හා ආකල්ප ඉහල නැංවීම සඳහා වැඩමුළු, සම්මන්ත්‍රන හා පුහුණු වැඩ සටහන් පැවැත්වීම.
- ශ්‍රවයාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා පරිවර්තන සේවා ලබාදීම තුලින් ශ්‍රවයාබාධිත වූවන් ගේ එදිනෙදා කටයුතු පහසු කිරීම.
- භාරකරුවන් අහිමි මන්ද මානසික පිරිමි ළමුන් සඳහා රැකවරන සැපයීම.
- ආබාධ සහිත පුද්ගලයන්ගේ සුභ සාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම.
- දෘශ්‍යාබාධිත දරුවන්ට ක්‍රීඩා, අධ්‍යාපනික හා සංස්කෘතික ආධාර ලබා දීම.
- මතට ඇබ්බැහිවූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම.
- ප්‍රජා මූලික අන්තර්කරණ සංවර්ධන වැඩ සටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා ලබා දීම.
- ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම, බල ගැන්වීම හා සක්‍රීයව පවත්වා ගැනීම.

## 4. දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය

**දැක්ම :**

"තිරසර සංවර්ධනයේ ආදර්ශමත් දිස්ත්‍රික්කය බවට පත්වීම."

**මෙහෙවර :**

"දිස්ත්‍රික්කයේ ජනතාව ජාතික සංවර්ධනයට දායක වන පරිදි රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් කාර්යක්ෂම ලෙස හා ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට හැකිවන සේ සැලසුම් සකස් කිරීම, මෙහෙය වීම, ඇගයීම, ප්‍රගති සමාලෝචනය හා සම්බන්ධීකරණ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම තුළින් තිරසාර සංවර්ධනයක් උදෙසා උපරිම දායකත්වයක් ලබාදීම."

**ප්‍රධාන කාර්යයන්**

- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හා අනෙකුත් සංවර්ධන කටයුතු වලට අදාළ ප්‍රධාන රැස්වීම් සම්බන්ධීකරණය හා මෙහෙය වීම.
- දිස්ත්‍රික්කයට අදාළ සියළු සංවර්ධන කටයුතු මෙහෙය වීම හා අධීක්ෂණය.
- අනෙකුත් රේඛීය අමාත්‍යාංශ ආයතන වල සංවර්ධන වැඩ සටහන් දිස්ත්‍රික්කය තුළ සම්බන්ධීකරණය හා මෙහෙය වීම.
- දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක විශේෂ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය.
- දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලයට අනුයුක්තව දිස්ත්‍රික්කය තුළ සේවය කරන නිළධාරීන්ගේ පරිපාලන හා ආයතන කටයුතු.
- දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය ආයෝජන සැලැස්ම සැකසීම.
- දිස්ත්‍රික්කය තුළ සම්පත් පරිහරනයේදී වැදගත්වන 'සම්පත් පැතිකඩ' සකස් කිරීම.

## 5. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**දැක්ම:** වසර 2030 වන විට දුගී බවින් තොර, සවිබල ගැන්වූ , සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක්, බිහි කිරීමට කටයුතු කරන, පුරෝගාමී ආයතනයක් බවට පත්වීම

**මෙහෙවර:** ආන්තීකරණයට පත් ජනතාව සවිබල ගැන්වීම ( ආර්ථික, සමාජීය, දේශපාලනික, භෞතික, මානසික, නෛතික හා පාරිසරික) හා ප්‍රාදේශීය විෂමතාවය අවම කිරීම සදහා කාර්යක්ෂම, සඵලදායී, වේගවත් හා ඵලදායී විසඳුම් ජන හිත කාමී ලෙස ක්‍රියාවට නැංවීම සදහා දෙපාර්තමේන්තු, ප්‍රජා මූල සංවිධාන හා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ජාලය හා වෘත්තිකයන්, රජය, පෞද්ගලික ජනතාව හා දේශපාලන අංශ වල මනා දායකත්වය හා දේශීය හා ගෝලීය ආයතන වලද සහභාගීත්වයෙන් දුගී බවෙන් තොර, සමෘද්ධිමත් දේශයක් ගොඩ නැංවීම තුලින් ආර්ථික සංවර්ධනයට දායක වීම.

**අරමුණු හා පරමාර්ථ** : දිළිඳුකම අවම කිරීම.

## 6. මෝටර් රථ ප්‍රවාහන අංශය

**දැක්ම :** විශිෂ්ඨ මෝටර් රථ නියාමනයේ ඉහළ මහජන ප්‍රසාදය

**මෙහෙවර :** අභිප්‍රේරණය වූ සේවක සමූහයේ සාමූහික ප්‍රයත්නය හා නවීන තාක්ෂණය යොදා ගනිමින් මොටර් රථ වාහන පනත හා අනෙකුත් නීතිරීති රෙගුලාසි ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ඉහල මහජන ප්‍රසාදයක් උදෙසා කැපවීම.

## 7. විමර්ශන අංශය

**දැක්ම :** හම්බන්තොට දිස්ත්‍රික්කයේ දූෂණ හා අක්‍රමිකතාවයන් තුරන් කිරීම වෙනුවෙන් ක්‍රියාකරන ප්‍රධානතම කාර්යක්ෂම හා ඵලදායී ඒකකය බවට පත් වීම

**මෙහෙවර:** හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් යටතේ පවත්නා රාජ්‍ය ආයතනයන් හි යහපාලනය උදෙසා අවශ්‍ය ගුණාංගයන්ගෙන් යුක්ත පරිපාලන ව්‍යුහයක් පවත්වා ගෙනයාම සහතික කරනු වස් දූෂණය හා අක්‍රමිකතාවයන්ට එරෙහිව කටයුතු කිරීම හා මෙහෙයවීම

**අරමුණු හා පරමාර්ථ:**

මහජනතාව විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි සහ දුක්ගැනවිලි සම්බන්ධයෙන් ක්‍රියා කරන බවටත් ඊට සාධාරණ ලෙස ප්‍රතිචාර දක්වන බවටත් මහජනතාව තුළ විශ්වාසය ගොඩනැංවීම.

**ඉටු කරනු ලබන කාර්යයන්:-**

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් ලේකම් යටතේ පවත්නා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල කාර්යාල කටයුතු හා නිලධාරින්ට විරුද්ධව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් මූලික විමර්ශන පැවැත්වීම, විමර්ශන වාර්තා සකස් කිරීම හා චෝදනා කෙටුම්පත් කිරීම.
- විධිමත් විනය පරීක්ෂණවලදී සාක්ෂි ලබා දීම හා පැමිණිල්ල මෙහෙයවීම.
- දිස්ත්‍රික් ලේකම් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.

## 8. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දිස්ත්‍රික් කාර්යාලය

**දැක්ම:** දේශයේ සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දෙන්නවුන් අතරින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

**මෙහෙවර:**ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්‍ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් වඩාත් ඵලදායී අයුරින් කාලීන වූත්, නිවැරදි වූත් දත්ත ලබාදීම මඟින් දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම.

**අරමුණු හා පරමාර්ථ:** සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී ප්‍රමාණවත් දත්ත හා තොරතුරු නොමැතිකම ගැටළුවක්ව පවතින මෙවන් අවධියක අරමුණු මුදුන්පත් කර ගැනීමට අනුගතව සැලසුම් සකස් කිරීම සඳහා සංඛ්‍යාන තොරතුරු යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සංඛ්‍යාලේඛන අංශයේ ප්‍රධාන අරමුණයි.

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංඛ්‍යාලේඛන අංශය ජනගහනය, කෘෂිකර්ම, කර්මාන්ත හා සේවා, අධ්‍යාපන, සෞඛ්‍ය, ශ්‍රම බලය, දේශපාලන හා ඓතිහාසික තොරතුරු ඇතුළත්ව විවිධ ක්ෂේත්‍ර රාශියක් පිළිබඳව සංඛ්‍යාත්මක දත්ත හා තොරතුරු රැස් කරනු ලබයි.

## 9. මිනුම් ඒකක ප්‍රමිතිසේවා කාර්යාලය

**දැක්ම :** මනා ලෙස සුරැකි පාරිභෝගික ප්‍රජාවක් සඳහා නිවැරදි සාධාරණ හා විශ්වාසනීය මිනුම් පද්ධතියක් පවත්වාගෙන යාම.

**මෙහෙවර:** ජාතික මිනුම් පද්ධතියේ වගකීම දරමින් මිනුම් ක්‍රමය පදනම් කරගත් නියාමක ක්‍රියාකාරකම් සහ හුවමාරු කාර්යයේදී යුක්තිය හා සාධාරණත්වය ඉටුකරන ප්‍රමුඛතම මිනුම් විද්‍යා ආයතනය වීම

**අරමුණු හා පරමාර්ථ:**

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මිණුම් විද්‍යා ආයතනය ලෙස කටයුතු කිරීම සහ **1995** අංක **35** දරණ මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත ක්‍රියාත්මක කරමින් මූලික මිණුම් විද්‍යාව, කර්මාන්ත මිණුම් විද්‍යාව හා නෛතික මිණුම් විද්‍යාව යන කේෂත්‍රයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**.**

- 1995 අංක 35 දරණ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතින් පැවරෙන කාර්යයන් හම්බන්තොට දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික් විද්‍යාගාරය පවත්වාගෙන යාම.
- කර්මාන්ත ක්ෂේත්‍ර වල භාවිතා වන මිනුම් අංක ශෝධනය කිරීම.
- වෙළඳ හා වානිජ කේෂත්‍රයේ භාවිතා වන කිරුම් උපකරණ මිනුම් උපකරණ හා පඩි සත්‍යාපනය කිරීම.
- නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ පාරිභෝගික අධ්‍යාපනය

## 10.පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**දැක්ම :** යහපත් වෙළඳ සමාචාර ගරු කරන ව්‍යාපාරික සමාජයක් තුල සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම.

**මෙහෙවර:** වෙළඳ ප්‍රජාව තුල යහපත් තරඟකාරිත්වය ප්‍රවර්ධනය කරමින් පාරිභෝගික සවිබල ගැන්වීම තුලින් පාරිභෝගික අයිතීන් සුරක්ෂිත කරලීම.

**අරමුණු/ පරමාර්ථ**

- පාරිභෝගිකයන්ගේ ජීවිත සහ දේපළ වලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීම සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම.
- අසාධාරණ වෙළඳ පිළිවෙත් වලින් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් වලට නිසි සැළකිල්ල දැක්වීමට සහතික වීම.
- හැකි සෑම විටම පාරිභෝගිකයන්ට තරඟකාරී මිලට භාණ්ඩ හා සේවා ලබා ගැනීමට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීම.
- වෙළඳුන් විසින් සිදු කරනු ලබන පාරිභෝගිකයන් සූරාකෑමට ලක්වන ආකාරයේ කටයුතු වලට එරෙහිව පාරිභෝගිකයන්ට සහන ලබාදීම.

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යයන්**

(අ) 1. ව්‍යවසායයන් අතර සීමාකාරී ගිවිසුම්,

2. ව්‍යවසායයන් අතර මිල පිළිබඳ වැඩපිළිවෙලවල්,

3. වෙළෙඳපොල ඇතුලත හෝ වෙළෙඳපොලේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්වයක් අනිසි ලෙස යොදා ගැනීම, හෝ

4. දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරගකාරිත්වය පිළිබද යම් අවහිරයක් පාලනය කිරීම හෝ ඉවත් කිරීම.

(ආ) තරග විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්වයක් අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ කිරීම.

(ඇ) භාණ්ඩ හා සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරගකාරිත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම.

(ඈ) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගතහැකි වීම සහ ඒවායෙහි තත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, මිලදී ගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිත කරන අයගේ අයිතිවාසිකම් හා සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.

(ඉ) මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබදව පාරිභෝගිකයන් දැනුවත් කිරීම.

(ඊ) මේ පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම.

(උ) වෙළෙඳපොල තරඟකාරිත්වය අඩු ඵලදායිතාවෙන් පවතින අවස්ථාවල දී වෙළෙඳපොලෙහි තරඟකාරි මිල ප්‍රවර්ධනය කිරීම.

(ඌ) වෙළෙඳපොල තත්ව සහ පාරිභෝගික කටයුතු වලට අදාලව අධ්‍යයන බාර ගැනීම, වාර්තා පල කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම.

(එ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යන භාර ගැනීම.

(ඒ) පාරිභෝගිකයන්ගේ මනා සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යාපන ප්‍රවර්ධනය කිරීම.

(ඔ) වෙළෙඳපොල තත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කරගැනීම ප්‍රවර්ධනය කිරීම.

(ඕ) පාරිභෝගික සංවිධාන පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම.

(ක) අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාවක් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම.

(ග) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය වියහැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත් කිරීම සහ,

(ච) අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍යය ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය සියලු වෙනත් කටයුතු කිරීම.

## 11. ඉඩම් පරිහරණ සැලසුම් අංශය

**දැක්ම:** දිස්ත්‍රික්කයේ භූමි සම්පත ප්‍රශස්ථ සහ තිරසාර ලෙස පරිහරණය කිරීම.

**මෙහෙවර:** අපගේ පාර්ශවකරුවන් ද, භූමිය පරිහරණය කරන්නන් ද තෘප්තිමත් වන සේ, කාර්යක්ෂම මෙන්ම සේවයට කැප වු කාර්ය මණ්ඩලයක් විසින්, පාරිසරික සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර සහ ප්‍රශස්ථ ලෙස භූමිය පරිහරණය කිරීමට සහාය වීම.

**අරමුණු හා පරමාර්ථ:** පොදුවේ මුළු මහත් සමාජයටම ප්‍රතිලාභ ලැබෙන පරිදි භූමි සම්පත ආරක්ෂා කිරීම, සංරක්ෂණය සහ සංවර්ධනය.

ඉටු කරනු ලබන කාර්යයන්:

- දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සහ ග්‍රාමිය මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සම්පාදනය.
- විවිධ කාර්යයන් සඳහා යෝග්‍ය සංවර්ධනය නොකරන ලද හෝ භාවිතා නොකරන ලද රජයේ ඉඩම් හඳුනා ගැනීම.
- ඉඩම් සඳහා යෝග්‍යතා වර්ගීකරණයන් සිදු කර පරිඝණක ගත දත්ත පද්ධතියක් සකස් කිරීම.
- ජාතික මට්ටමේ ඉඩම් පරිහරණ සමීක්ෂණ කටයුතු සඳහා දායක වීම.
- දිස්ත්‍රික්කය තුල ක්‍රියාවට නැගෙන විවිධ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම සහ නිදහස් කිරීම සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම.
- ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුල ඉඩම් බෙදා දීම සහ වෙන් කර දීම යනාදි කරුණු පිලිබඳව වූ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ප්‍රාදේශිය ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම.
- වැරදි ඉඩම් භාවිතයන් හේතු කොට ගෙන ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කිරීමේ අරමුණින් පාසල් සිසුන්, ප්‍රජාව හා ඉඩම් පරිහරණයට අදාල රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල නිලධාරින් දැනුවත් කිරීම සඳහා විවිධ මට්ටමින් දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
- ප්‍රාදේශිය ඉඩම් පරිහරණ සැලසුම් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාලව ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- හායනයට පත් ඉඩම් පුනරුත්ථාපනය කිරීම සඳහා වැඩ සටහන් පැවැත්වීම.
- ග්‍රාමිය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- බිම් කට්ටි මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශණ ස්ථාපිත කිරීම.
- ඉඩම් පරිහරණ ගැටලු සහිත ඉඩම් සඳහා අදාල විශේෂ ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- විවිධ ආයතනවලින් ලැබෙන ඉල්ලීම් අනුව විවිධ අවශ්‍යතා සඳහා යෝග්‍ය ඉඩම් හඳුනා ගැනීමට ඉඩම් ඇගයීම් සිදු කර ඉඩම් යෝග්‍යතා වාර්තා ලබා දීම.
- තිරසර පාසල් සංවර්ධන වැඩ සටහන.
- උප ජලාධාර ප්‍රදේශ පදනම් කරගෙන ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම.
- පස හා ජලය සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ඉඩම් පරිහරණයට අදාල විශේෂ අධ්‍යයනයන් සිදු කිරීම.

## 12. ඉඩම්, විවාහ, උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය-හම්බන්තොට

**දැක්ම :** තිරසාර සංවර්ධනය තුළින් ඵලදායී රාජ්‍ය සේවයක් ඉටු කිරීම.

**මෙහෙවර :** ශ්‍රී ලංකාවේ නිශ්චල හා චංචල දේපල වලට අදාළ නීත්‍යානුකූල ලේඛණ ලියාපදිංචි කිරීම සහ ජන ජීවිතයේ මූලික ගෘහස්ත සිදුවීම් වන විව, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමෙන්ද එම ලේඛණ වලින් සහතික ලිටපත් නිකුත් කිරීමෙන්ද අයිතීන් රැකගැනීම පිණිස ජනතාවට සහාය වීම.

**අරමුණු හා මෙහෙවර:**

ප්‍රසන්න, කාර්යක්ෂම හා සුහදශීලී මහජන සේවාවක් පවත්වා ගැනීමෙන් ලැබෙන සියළු ඔප්පු එදිනම වැඩ අවසන් කිරීමෙන් ලැබෙන සියළු උද්‍යත පිටපත් ඉල්ලුම් පත්‍ර සඳහා මිනිත්තු 20 ක් තුල සහතික පිටපත් නිකුත් කිරීමත් අපගේ අරමුණු වේ.

## 13.වෘත්තීය මාර්ගෝපදේශ හා මානව සම්පත් අංශය

**දැක්ම :** ලෝක මට්ටමේ ශ්‍රී ලාංකීය ශ්‍රම බලකායක් .

**මෙහෙවර :** "පුළුල් නිපුනතාවයෙන් යුත් ක්‍රියාශීලි සහ ගෝලීය වශයෙන් තරහකාරී ශ්‍රම බලකායක් ගොඩ නැගීම අපේ මානව සම්පත් වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම."

**අරමුණු හා පරමාර්ථ :**

- ගෝලීය වශයෙන් තරගකාරී, නිපුණතාවයෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ගොඩනැංවීම.
- විරැකියාව අවම කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- සංවිධිත පරිපූර්ණ ශ්‍රම වෙළඳ පොළ තොරතුරු පද්ධතියක් ඇති කිරීම.

**ඉටු කරනු ලබන කාර්‍යයන්**

- ජාතික මිනිස්බල ප්‍රතිපත්තිය සකස්කර, ප්‍රතිපත්තිය සහ අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කුසලතා නොගැළපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටලුව විසඳීම.
- වර්තමාන ශ්‍රමබලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
- මිනිස්බල සැලසුම් කිරීම, සංවර්ධනය හා පුරෝකථනය.

- අවිධිමත් අංශය සංවර්ධනය.
- පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂකයින් පෙළඹවීම.
- නිදහස් රාජ්‍ය රැකියා සේවය ලබාදීම.
- අවධානමට ලක්වී ඇති කණ්ඩායම්, ආබාධිත පුද්ගලයින් සහ ඌන සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයින් සඳහා මිනිස්බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම.
- ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියලුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම.
- දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ නැම්යාවන් පුරෝකථනය.

## 14.දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය

**දැක්ම :** වඩාත් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් කරා

**මෙහෙවර :** ස්වභාවිකව සහ මිනිසා විසින් නිර්මාණය කරන ලද ව්‍යසන ඵලදායිව වලක්වා ගැනීම හා අවම කිරීම තුළින් සාමකාමී, සෞභාග්‍යමත් සහ ගෞරවනීය වූ මිනිස් ජීවිතයකට වාසස්ථානයක් ශ්‍රී ලංකාව තුළ ඇති කිරීම.

**අරමුණු හා පරමාර්ථ :**

අමාත්‍යංශය වෙත පවරා ඇති කාර්යයන් ක්‍රියාත්මක කරනු පිණිස අමාත්‍යාංශයේ කටයුතු පහත සඳහන් පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර තුනකට බෙදා ඇත. ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ආපදා වලින් ජන ජීවිත, දේපළ සේවා සුරක්ෂිත කිරීම. (වැළැක්වීම, අවම කිරීම, පෙරසූදානම, පර්යේෂණ සහ සංවර්ධන) ප්‍රත්‍යස්ථ සමාජයක් උදෙසා ප්‍රජා සුරක්ෂිතභාවය තහවුරු කිරීම. (පූර්ව අනතුරු ඇඟවීම්, හදිසි මෙහෙයුම්, මුදවා ගැනීම හා සහන සේවා) පශ්චාත් ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම. (යථා තත්ත්වයට පත් කිරීම, පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය)

**ඉටුකරනු ලබන කාර්යයන් -**

මෙම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා 2010 නොවැම්බර් 22 නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් අමාත්‍යාංශය වෙත පහත සඳහන් කාර්යයන් පවරා ඇත. ස්වාභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපත්වල දී සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය, ව්‍යසන අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම හා යථාත්වීකරණය පිළිබඳ ප්‍රතිපත්ති, වැඩ සටහන් හා ව්‍යාපෘති සම්පාදනය, අදාල අරමුණ සපුරා

ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකඟතාවයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම ජාතික ප්‍රතිපත්තිය මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම හා හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම, ව්‍යසන අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම සහ යථාත්වීකරණය පිළිබඳ විදේශීය ආධාර ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය. ඉහත කාර්යයන් නිසි වේලාවට ක්‍රියාත්මක වීම සහතික කර ගැනීම පිණිස අමාත්‍යාංශය හා රාජ්‍ය සංවිධාන සමග සම්බන්ධීකරණය. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම. ගංවතුර, නියගය , නායයෑම්, වසංගත රෝග සහ වෙනත් විශේෂ හේතූන් නිසා සිදුවන ආපදාවන්හි දී සහන සැලසීම. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන වලදී ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම. පෙර අනතුරු ඇඟවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම. නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ කටයුතු, අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවතින ආයතනවල අනෙකුත් සියළුම විෂයයන් හා අධීක්ෂණ කටයුතු, ආපදා අවම කිරීමේ ව්‍යාපෘති, ආපදා පෙර සූදානම් සහ සැලසුම් වැඩසටහන්, පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්, හදිසි ප්‍රතිචාර දැක්වීම.

## 15.සංස්කෘතික අංශය

**දැක්ම :** නිවුණු හැදුණු පිරුණු සොඳුරු මිනිසුන් පිරි පින්බර දේශයක් එක්ව ගොඩනගමු

**මෙහෙවර :** ශ්‍රී ලාංකීය අනන්‍යතාවයෙන් යුත් සාහිත්‍ය කලා හා සංස්කෘතික කටයුතු සංරක්ෂණය, ප්‍රවර්ධනය, ව්‍යාප්තිකරණය සඳහා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

**අරමුණු හා පරමාර්ථ:**

- හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංස්කෘතික කටයුතු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ සාහිත්‍ය කලාව සංරක්ෂණය හා ප්‍රචාරණයට අදාලව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලේඛකයා හා කලාකරුවා සංස්කෘතියේ සාමාජිකයන් යැයි සලකමින් ඔවුන්ට අධාර ලබා දීම හා නිර්මාණකරණය සඳහා අවශ්‍ය සහය ලබා දීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කය බහු සංස්කෘතික දිස්ත්‍රික්කයක් ලෙස සලකා සියලු උප සංස්කෘතීන්ට සාධාරණ ආකාරයෙන් ඔවුන්ගේ කලාව හා කලා ශිල්ප සංරක්ෂණය ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

- හම්බන්තොට දිස්ත්‍රික්කයේ දෘෂ්‍ය හා අදෘෂ්‍ය සංස්කෘතිකාංගයන්ට පුනර්ජීවය දෙමින් ඒවා සමාජයේ සියළු අංශ කරා කාන්දු වන ආකාරයෙන් වැඩ සටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම තුලින් සාරධර්ම වලින් පිරි සමාජයක් ගොඩ නැගීම.

## 16.ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**දැක්ම:** ශ්‍රී ලංකාවේ ළමයින් සඳහා ළමා හිතකාමී සහ ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රය බවට පත්වීම

**මෙහෙවර :** සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ශ්‍රී ලංකාවේ සෑම ළමයකුම ආරක්ෂා කරනු ලැබීම සහතික කිරීම

**අරමුණු :**

- ළමා අපයෝජනය වැලැක්වීම, ළමා ආරක්ෂාව සහ වින්දිත ළමුන් පුනරුත්තාපනය සඳහා යොමු කිරීම යන සියල්ල සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට අවශ්‍ය සහාය දැක්වීම.
- දිස්ත්‍රික්කය තුළ ළමා අපයෝජනයන්ට එරෙහි ක්‍රියා සම්බන්ධීකරණය කිරීම, නියාමනය කිරීම සහ ළමා අපයෝජනයන් සම්බන්ධ අනෙකුත් සියළුම ක්‍රියා පිළිබඳව ක්‍රියාත්මක වීම.

## 17. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

**දැක්ම:** තිරසාර සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වය හා ව්‍යාපාර සංවර්ධනය

**මෙහෙවර:** තරුණ තරුණියන් ව්‍යවසායකත්ව ක්ෂේත්‍රය තුළ සේවා නියුක්ත කිරීම තුලින් රැකියා වියුක්තිය අවම කරමින් නවීන අභියෝග සඳහා මුහුණ දිය හැකි ස්ථාවර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ දායකත්වය ජාතික ආර්ථිකයට එක් කිරීම.

**අරමුණු හා පරමාර්ථ:**

- රැකියා විරහිත තරුණ තරුණියන්ට රැකියා අවස්ථා උදා කර දීම.
- නොසැලෙන ව්‍යවසායකත්ව සංස්කෘතියක් ගොඩ නැගීම.
- සාර්ථක ව්‍යාපාර ගොඩ නැගීම සඳහා තරුණ තරුණියන්ට සහයෝගය ලබාදීම.
- කුඩා ව්‍යාපාර වල නියුතු තරුණ තරුණියන්ට එම ව්‍යාපාර වැඩි දියුණු කිරීමට අවශ්‍ය උපදේශන සේවා ලබා දීම.
- කුඩා ව්‍යාපාර සංවර්ධන ක්ෂේත්‍රයට අදාල රාජ්‍ය ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමට සහාය ලබා දිම.
- කුඩා ව්‍යාපාරිකයන්ට අදාල වෙළඳපල අවස්ථා පුළුල් කිරීම.
- අපනයන අභිමුඛ ව්‍යාපාර ඇරඹීමට කුඩා ව්‍යාපාරිකයන් පෙළඹවීම.
- විවිධ ක්ෂේත්‍ර වලට අදාලව ව්‍යවසායකයින් පුහුණු කිරීම.

## 18. සමාජ ආරක්ෂණ මණ්ඩලය

**දැක්ම :** ඵලදායි හා තිරසාර සමාජ ආරක්ෂණය සඳහා වූ ජාතියේ ප්‍රමුඛතම ආයතනය වීම.

**මෙහෙවර ප්‍රකාශය:** සහභාගීත්වය හා නිර්මාණශීලී සංවිධාන පරිසරයක් තුළින් රාජ්‍ය සුරක්ෂිතභාවය සහිත වඩා ඵලදායි සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරිමේ ජාතික ආයතනය බවට පත්වෙමින් නිවහල් පුරවැසියන් බිහිකිරීමට දායක වීම

**අරමුණු හා පරමාර්ථ:** හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ විශ්‍රාම වැටුපක් නොලබන ජනතාව දැනුවත් කිරීම.

**ඉටුකරනු ලබන කාර්යයන් :** ඉහත අරමුණු ඉටුකරගැනීම සඳහා දිස්ත්‍රික්කය තුල සිටින ඉලක්ක ගත ප්‍රජාව දැනුවත් කිරීම හා බඳවා ගැනීමට කටයුතු කිරීම.

## 19. අභ්‍යන්තර විගණන අංශය

**දැක්ම :** රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව යහපත් රාජ්‍ය සේවයක් පවත්වාගෙන යාමට දායක වීම.

**මෙහෙවර :** දිස්ත්‍රික් ලේකම් බල ව්‍යූහයට අනුගත රාජ්‍ය ආයතන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව ක්‍රියා කිරීමේ මාර්ගෝපදේශකයන් ලෙස ස්වාධීන පාර්ශවයක් වශයෙන් සේවා සැපයීම මගින් දිස්ත්‍රික්කය තුල යහපත් රාජ්‍ය සේවයක් පවත්වා ගෙන යාම.

**අරමුණු හා පරමාර්ථ :**

- රජයේ විගණන ප්‍රමිතීන්ට අනුකූලව අභ්‍යන්තර විගණනය පවත්වාගෙන යාම.
- මහජනතාවට විශිෂ්ඨ සේවයක් ලබා දිමට අවශ්‍ය වාතාවරණය ගොඩනැගීම.
- මහජනතාවට ගුණාත්මක රාජ්‍ය සේවයක් ඉටුවන්නේදැයි සොයා බැලීම.
- රාජ්‍ය ආයතන වලට අවශ්‍ය දැනුම කුසලතාව හා මග පෙන්වීම.
- රාජ්‍ය සම්පත් අයතා ලෙස භාවිතා කිරීම වලක්වා ගැනිමට අවශ්‍ය කටයුතු කිරීම.

**ඉටු කරනු ලබන කාර්යයන්**

- හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විගණනය කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වවුචර් පරික්ෂාව.
- විගණන හා කළමණාකරණ කමිටුව පැවැත්වීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විගණන කළමනාකරණ කමිටු සඳහා සහභාගී වීම.
- මූල්‍ය හා අභ්‍යන්තර පාලනය සම්බන්ධ උපදෙස් හා මග පෙන්විම් කිරීම.
- දිස්ත්‍රික් ලේකම් පවරණ විශේෂ විගණනයන් කිරීම.
- විමර්ෂණ කටයුතු.

## 20. ඵලදායිතා ප්‍රවර්ධන ඒකකය

**දැක්ම :** ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීමෙහිලා ආසියාවේ විශිෂ්ඨතම කේන්ද්‍රස්තානය බවට පත් කිරීම.

**මෙහෙවර :** ශ්‍රී ලංකාවේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීමෙන් ජාත්‍යන්තර තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා අවශ්‍ය වන්නාවූ ශක්තිය ලබාදීම සහ ජාතික සංවර්ධනයට දායකවීම තුළින් ජනතාවට උසස් ජීවන තත්ත්වයක් ලබා දීම.

**පරමාර්ථ :**

- පළමුව පාරිභෝගිකයා.
- දැනුම හුවමාරුව.
- ඉගෙනුම් සංස්කෘතිය.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්.
- ඵලදායී හා ගුණාත්මක සේවාවක්.
- ජාතික සංවර්ධනයට ප්‍රමුඛතාවය.

## 21. බෞද්ධ කටයුතු අංශය

**දැක්ම:** ‘‘බොදු පිළිවෙත් සුරකින දැහැමි සමාජයක් කරා ’’

**මෙහෙවර :** සම්බුද්ධ ශාසනයේ චිරස්තිථිය, ප්‍රවර්ධනය හා උන්නතිය සඳහා වන කාර්යයන් හා කර්තව්‍යයන් මැනවින් සංවිධානයකොට ක්‍රියාත්මක කරළීම තුළින් දේශිය බෞද්ධ ජනතාවගේ ප්‍රබෝධයට හේතුවන දැහැමි හා ගුණගරුක බෞද්ධ සමාජයක් බිහිකරලීම හා ආදර්ශමත් බෞද්ධ සමාජයක අඛණ්ඩ පැවැත්ම සාක්ෂාත් කරලීම.

**අරමුණු සහ පරමාර්ථ:**

- දිස්ත්‍රික්කයේ සියළුම විහාරස්ථාන හා දහම් පාසල් සංවර්ධන වැඩසටහන්වලට ඇතුළත් කිරිම.
- දිස්ත්‍රික්කයේ සිදුවන සදාචාර විරෝධි ක්‍රියාවන් අවම කිරිමට අදාළ වැඩසටහන් සංවිධානය කිරිම.
- දහම් පාසල් ප්‍රතිඵල අනුව සමස්ත ලංකා මට්ටමින් දිස්ත්‍රික්කය ප්‍රථම ස්ථානයට ගැනිම.
- දිස්ත්‍රික්කයේ සියළුම විහාරස්ථාන හා දහම් පාසල් වෙත එක ලෙස ප්‍රතිලාභ ලැබිමට සැළැස්විම.
- භෞතික හා ආධ්‍යාත්මික වශයෙන් සමබර සංවර්ධනයක් සහිත දිස්ත්‍රික්කය බවට පත්කිරිම.
- භික්ෂූන්වහන්සේලාගේ අනුශාසනා පරිදි සෑම ආගමික වැඩසටහනක්ම නිසි පරිදි සංවිධානය කිරිම.

**ඉටුකරනු ලබන කාර්යයන් :**

- දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 12 සහ ශාසනාරක්ෂක මණ්ඩල 15 සම්බන්ධිකරණය
- දිස්ත්‍රික්කයේ සියළුම විහාරස්ථාන හා දහම් පාසල් සඳහා ආධාර ලබාදිමේ කටයුතු සිදු කිරිම.
- දහම් පාසල් ගුරු භවතුන් පුහුණු කිරිම හා තොරතුරු යාවත්කාලින කිරිම.
- දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල රැස්විම කැදවිම හා වාර්තා පවත්වාගෙන යාම.
- භික්ෂුන් වහන්සේලාගේ ඉල්ලිම් අදාළ ආයතන වෙත යොමු කිරිම හා පසු විපරම් කිරිම.
- වාර්ෂික දහම් පාසල් ගුරු සිසු තොරතුරු යාවත්කාලින කිරිම.
- වාර්ෂික දහම් පාසල් සිසු නිපුණතා දිස්ත්‍රික් තරග පැවැත්විම හා සමස්ත ලංකා තරගය සම්බන්ධිකරණය කිරිම.
- සංවර්ධන වැඩසටහන්වල වාර්ෂික ප්‍රගතිය ඉදිරිපත් කිරිම.
- පුණ්‍යග්‍රාම, දහම් සරසවිය, පාලි භාෂා ප්‍රවර්ධනය වැනි විශේෂ දිස්ත්‍රික් වැඩසටහන් පැවැත්විම.
- දහම් පාසල් පෙළ පොත් බෙදා හැරිමේ කටයුතු සිදු කිරිම
- දිස්ත්‍රික්කයේ පැවැත්වෙන පෙරහැර කටයුතුවලට අවශ්‍ය සහය ලබාදිම.
- ප්‍රාදේශිය මට්ටමේ පැවැත්වෙන දහම් පාසල් උත්සව ආදි අවස්ථාවලට සහභාගි විම.
- වාරියපොල ශ්‍රී සුමංගල නා හිමි, අනගාරික ධර්මපාලතුමා, ආදි දිස්ත්‍රික් ගුණ සමරු සංවිධානය
- සංවර්ධන වැඩසටහන් සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කිරිම.
- කාර්යාල පරිශ්‍රයේ වෙසක් පොසොන් වැනි විශේෂ දින අලලා ආගමික වැඩසටහන් සිදුකිරිම.
-

## 22. කෘෂිකර්ම අංශය

**දැක්ම :-** ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායි හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක්.

**මෙහෙවර:-** ස්වාභාවික සම්පත් තිරසාර කළමණාකරණය තුලින් සමාජීය වශයෙන් පිලිගත් නව්‍ය හා වානිජමය නැඹුරුවකින් යුතුව, ගෝලීය තරඟකාරී නිෂ්පාදනයන් බිහිකරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කරගැනීම.

**අරමුණු හා පරමාර්ථ :-**

- ආහාර ආශ්‍රිත කෘෂිබෝග විෂයෙහි ප්‍රතිපත්තිමය සහාය සැපයීම.
- ආහාර හා පෝෂිත සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
- කෘෂි නිෂ්පාදනය සඳහා ස්ථාවර මිලක් පවත්වා ගැනීම.
- ව්‍යාපෘති නිසි කලට ක්‍රියාත්මක කිරීම.
- තෝරාගත් බෝගවල නිෂ්පාදනය ඉහළ නැංවීම.
- කඩිනම් ආහාර නිෂ්පාදන වැඩසටහන් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම.
- විදේශ අරමුදල් කාර්යක්ෂම හා ඵලදායි ලෙස යෙදවීම.
- සේවා ලාභීන්ට මිත්‍රශීලී හා ප්‍රතිඵල අරමුණු කරගත් පරිපාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- සමස්ථ රාජ්‍ය සේවය තුල ඵලදායී කළමණාකරණයක් ඇතිකිරීම.

**ඉටුකරනු ලබන කාර්යයන් :-**

- කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම.
- කෘෂි තාක්ෂණික තොරතුරු ගොවීන් වෙත ලබාදීමේ ක්‍රියාවලියට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- ගොවි ප්‍රජාව මුහුණ දෙන වගා ගැටළු විසඳීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.
- දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව පැවැත්වීම සහ ඊට අදාල කටයුතු ඉටු කිරීම.
- දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික තොරතුරු එක්රැස් කිරීම, වාර්තා කිරීම සහ සමාලෝචනය.

## <u>23. ගිණුම් අංශය</u>

**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ ව්‍යුහය හා කාර්යභාරය</u>**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම හා මෙහෙවර අනුව අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කිරීමේදී මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතු වඩාත් වැදගත් වේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රජයේ මූල්‍ය කටයුතු වලදී A පන්තියේ දෙපාර්තමේන්තුවක් ලෙස සලකනු ලබන අතර රජයේ වාර්ෂික ඇස්මේන්තුවෙන් 263 වැය ශීර්ෂයෙන් 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසන ලදි. මූල්‍ය කටයුතු වලදී දිස්ත්‍රික් ලේකම් ගණන් දීමේ නිළධාරියා වශයෙන් වගකිව යුතු වේ.

<u>ව්‍යුහය</u>

01 පාලන ගිණුම් අංශය: ව්‍යාපෘති 01 හා 02 මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.

02. ගිණුම් අංශය: දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ සාමාන්‍ය පරිපාලන හා ආයතන සේවා.

<u>ප්‍රධාන කාර්යයන්</u>

මූල්‍ය කළමනාකරණය සහ ගිණුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යයන් නම්,

- වාර්ෂික ඇස්තමේන්තුවෙන් ලබා දී ඇති මූලධන හාපුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන සහ ඒ අනුව මාසිකව භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා අක්මුදල් බෙදාදීම, කළමනාකරණය කිරීම, අධීක්ෂණය හා පාලනය කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ග්‍රාම නිළධාරී කොට්ඨාශ මට්ටමින් කරනු ලබන රජයේ කටයුතු සමායෝජනය කිරීම සහ නීතියෙන් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමත් අදාළ ගෙවීම් කිරීම හා ආදායම් රැස් කිරීම.

- වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවල නියෝජිත වශයෙන් කරනු ලබන මූලධන හා පුනරාවර්තන ගෙවීම් හා ආදායම් රැස්කිරීම හා ප්‍රේෂණය කිරීම.
- විමධ්‍යගත අයවැය වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාල ගෙවීම් කිරීම.

**<u>ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12</u>**

01. හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
02. තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
03. අම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
04. වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
05. බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
06. කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
07. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
08. ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
09. ඕකෙවෙළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
10. සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
11. අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
12. වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

<u>02 පරිච්ඡේදය</u>

### ප්‍රගතිය හා ඉදිරි දැක්ම

➢ **විශේෂ ජයග්‍රහණ**

රජය විසින් 2016 වර්ෂයේදි හදුන්වා තිරසාර සංවර්ධන අරමුණු 17 ඉටුකර ගැනීම සඳහා රජය විසින් හඳුන්වාදෙන වැඩසටහන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් කිරීමේදී අවශ්‍ය සම්බන්ධීකරණය හා මහපෙන්වීම සිදු කරමින් ලබාදෙන ඉලක්ක ඒ අයුරින්ම ඉටු කිරිමට හැකිවිම.

තවද 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව ඒවායේ සඳහන් කාර්යන් අදාල කාල රාමුව තුල ක්‍රියාත්මක කිරීම තුලින් කාර්ය සාධන දර්ශකයන් අනුව ඒවායේ ප්‍රතිඵල ලගා කර ගැනීමට හැකිවීම.

➢ **අභියෝග**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පසුගිය වර්ෂයේ පැවති අයහපත් කාලගුණික තත්වය හේතුකොට ගෙන අපගේ ඉලක්ක සපුරා ගැනීමට නොහැකි තත්වයක් උදා විය.

ඇතැම් අවස්ථා වලදී රජය විසින් ලබා දුන් ප්‍රතිපාදන සීමා කිරීම සහ අක්මුදල් සීමා කිරීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල කාර්යන් නර ගැනීමට බාධා එල්ල විම.

➢ **ඉදිරි ඉලක්ක**

- ආයතනයේ සේවක මණ්ඩලය හා ආයතනය සතු අනෙකුත් සියලුම සම්පත් කාර්යක්ෂමව හා ඉහල ඵලදායිතාවයකින් යුතුව මහජන සේවය සඳහා යෙදවීමට අවශ්‍ය මානව සම්පත් පුහුණු වැඩසටහන් තුලින් සංවර්ධනය කිරීම.
- සූරියවැව නව ප්‍රාදේශය ලේකම් කාර්යාලයක් ඉදිකිරිම.
- අගුණකොළපැලැස්ස හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඉදිකිරිම් අවසන් කර මහජනතාවගේ අවශ්‍යතා සඳහා ලබා දීම.
- දිස්ත්‍රික්කය තුල සියලු සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම තුලින් දිස්ත්‍රික්කයේ සංවර්ධනය ඉහළ නැංවීම.

ඩබ්ලිව්.එච්.කරුණාරත්න,

දිස්ත්‍රික් ලේකම්/දිසාපති,

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

ඩබ්ලිව්. එච්. කරුණාරත්න
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

**03 පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

**3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

**ඒසීඒ-එෆ්**

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | තත්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | **ඒසීඒ-1** |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 3,436,248,000 | 3,412,259,949 | **ඒසීඒ-3** |
| - | තැන්පතු | | 876,397,002 | 669,451,137 | **ඒසීඒ-4** |
| - | අත්තිකාරම් ගිණුම් | | 7,108,815 | 66,156,983 | **ඒසීඒ-5/5(ඒ)/5(බී)** |
| - | වෙනත් ලැබීම් | | 546,946,465 | 1,153,199,375 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **4,933,673,282** | **5,301,067,443** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **4,933,673,282** | **5,301,067,443** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 647,650,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 633,910,014 | 581,706,389 | |
| 161,463,870 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 155,153,172 | 156,592,840 | **ඒසීඒ-2(ii)** |
| 5,500,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 4,616,223 | 4,903,636 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| - | පොළී ගෙවීම් | **8** | - | - | |
| 36,130 | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | 36,130 | - | |
| **814,650,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **793,715,539** | **743,202,865** | |
| | **මූලධන වියදම්** | | | | |
| 24,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 13,940,951 | 34,411,349 | |
| 115,600,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 64,534,798 | 110,741,219 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | **ඒසීඒ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 2,400,000 | හැකියා වර්ධනය | **14** | 2,251,893 | 2,656,738 | |
| 1,350,000 | වෙනත් මූලධන වියදම් | **15** | 1,150,003 | 174,692,704 | |
| **143,350,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **81,877,645** | **322,502,009** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **995,192,894** | **665,128,766** | |
| | **තැන්පතු ගෙවීම්** | | 905,390,922 | 575,606,446 | **ඒසීඒ-4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 89,801,972 | 89,522,320 | **ඒසීඒ-5/5(ඒ)/5(බී)** |
| | **මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)** | | **1,870,786,078** | **1,730,833,639** | |
| - | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **3,062,887,204** | **3,570,233,804** | |

## 2019 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 5,088,775,029 | 4,979,845,868 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 213,312,140 | 204,869,591 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 4,658,075 | - |
| **මුළු වත්කම්** | | **5,306,745,244** | **5,184,715,459** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | (54,423,102) | (93,280,279) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 5,088,775,029 | 4,979,845,868 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 267,735,241 | 298,149,870 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 4,658,075 | - |
| **මුළු වගකීම්** | | **5,306,745,244** | **5,184,715,459** |

